# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,723 - 2011 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2011.09.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1310 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1311 |

*සැ. යු.* - (i) ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත් කෙටුම්පත 2011 අගෝස්තු මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 සැප්තැම්බර් මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 සැප්තැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1307- B 80357— 8,900 (2011/09)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දූරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ වෛද්‍ය රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 ඔක්තෝබර් මස 10 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 අගෝස්තු මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | මාතර | මාතර නගර කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |

09-330

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 ඔක්තෝබර් මස 10 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 අගෝස්තු මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | මාවනැල්ල | ගල්බඩ කිණිගොඩ කෝරළය කොට්ඨාසයේ උයන්වත්ත (දෙවනගල) ප්‍රදේශයේ අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

09-331

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010 (2011)

ඉහත සේවාවේ නිලධාරීන් සඳහාවූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2011 දෙසැම්බර් මස ආරම්භ කොට පේරාදෙණියේදී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2011 වසරේ ජූනි මස 01 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. විෂය නිර්දේශය.—I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග I සඳහාවන විෂය නිර්දේශ ඇමුණුම "අ" හි ද කාර්යක්ෂමතා කඩඉම් II සඳහාවන විෂය නිර්දේශය "ආ" හි ද සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය. :

### ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය

| *I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය* | | | *II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය* | | |
|---|---|---|---|---|---|
| *විෂය අංකය* | *විෂයය* | *කාලය (පැය)* | *විෂය අංකය* | *විෂයය* | *කාලය (පැය)* |
| 01 | මූල්‍ය ක්‍රම | 03 | 01 | කොටස් 01 | 03 |
| 02 | පරිපාලනය | 03 | 02 | කොටස් 02 | 03 |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය - I | 02 | 03 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - I | 03 |
| 04 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය - II | 03 | 04 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - II | 03 |
| 05 | විශේෂ ප්‍රශ්න පත්‍රය* | 03 | 05 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - III | 03 |
| | | | 06 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - IV | 03 |
| | | | 07 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - V | 03 |
| | | | 08 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - VI | 03 |
| | | | 09 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - VII | 03 |
| | | | 10 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - VIII | 03 |
| | | | 11 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - IX | 03 |
| | | | 12 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - X | 03 |
| | | | 13 | කොටස් 03 ප්‍රශ්න පත්‍රය - XI | 03 |

* මේ සඳහා අයදුම් කළ යුත්තේ පශු පර්යේෂණ නිලධාරීන් පමණි.

*සටහන.*—II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ අයදුම්කරුවන් පෙනී සිටිය යුත්තේ කොටස් 01 හෝ කොටස් 02 යන ප්‍රශ්න පත්‍ර දෙකින් එකකට හා 03හි සඳහන් ප්‍රශ්න පත්‍ර XI න් ප්‍රශ්න පත්‍ර දෙකකට පමණි. සාමාර්ථ්‍යය සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවමන් වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

05. පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය.

06. පහත දැක්වෙන ප්‍රශ්නපත්‍රවලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් උත්තර සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා විභාග කොමසාරිස් ජනරාල් විධිවිධාන සලස්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| | |
|---|---|
| I | මූල්‍ය ක්‍රම |
| II | පරිපාලනය |
| III | දෙපාර්තමේන්තු රෙගුලාසි I |
| IV | දෙපාර්තමේන්තු රෙගුලාසි II |

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර අමුනා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. ඉහත සඳහන් පරීක්ෂණ දෙකටම පෙනී සිටින්නේ නම් වෙන වෙනම එක් එක් විභාගයන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස්

ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

10. ඉල්ලුම්පත්‍ර 2011 සැප්තැම්බර් මස 30 දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ගැටඹේ, පේරාදෙණිය.

11. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

12. ඉහත II වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 1971 ජුනි මස 29 වැනි දින අංක එස්ඊ274 දරන චක්‍රලේඛය කෙරෙහි සියලුම අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරනු ලැබේ. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වනු ඇත. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ **පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි.**

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. :—

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා

| | රු. ශත |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | 400 0 |
| එක් විෂයකට | 200 0 |

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට/දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

ඒ. එච්. ගමගේ,
ලේකම්,
පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ 03,
ශාන්ත මයිකල් පාර,
අංක 45,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010 (2011)

Efficency Bar Examination for Officers in the Sri Lanka Animal Production and Health Service 2010 (2011)

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)
(කාර්යක්ෂමතා කඩඉම් විභාග 02 ටම එකවර පෙනී සිටින්නේ නම් ඒ සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර 02ක් එවිය යුතුය)

* නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

නිලධාරියා ඉල්ලුම් කරන විභාගය :
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 1
දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (අ) මුලකුරු අගට යොදා මුල් අකුරු සමග නම :————.
(*උදා* : Nimalsiri K. A.)

(ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

03. පදවි නාමය :————.
දෙපාර්තමේන්තුවේ නම :————.

04. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත්කරන ලද දිනය :————.

06. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිළිව සඳහන් කළ යුතුය.)

(i) විෂය අංකය ☐☐ විෂයය :————.

(ii) විෂය අංකය ☐☐ විෂයය :————.

(iii) විෂය අංකය ☐☐ විෂයය :————.

(ii) විෂය අංකය ☐☐ විෂයය :————.

(iv) විෂය අංකය ☐☐ විෂයය :————.

07. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම්, විෂයයන්ද, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :————.

08. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

09. ගෙවන ලද විභාග ගාස්තුව රු. :

| ලදුපත ඇලවීම සඳහා (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

————,
අපේක්ෂකයාගේ අත්සන

දිනය :————.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙහි විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවද සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
පදවි නාමය.

දිනය :————.

(*ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතුය.)

*"අ" ඇමුණුම*

(අ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :–

1. මූල්‍ය ක්‍රම
2. පරිපාලනය
3. දෙපාර්තමේන්තු රෙගුලාසි - I
4. දෙපාර්තමේන්තු රෙගුලාසි - II

1. *මූල්‍ය ක්‍රමය*

මූල්‍ය ක්‍රම පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :–

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ මුදල් රෙගුලාසි - x වැනි පරිච්ඡේදය හැර)
(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තුගත (උදා : ඒවා සකස් කිරීම, ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්)
(ඇ) කච්චේරි මඟින් විශේෂයෙන් කරගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥා පනත්

* *සටහන* : සාමාර්ථ්‍යය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

2. පරිපාලනය

පරිපාලනය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ.

(අ) කාර්යාල හා ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම
(ආ) ආයතන සංග්‍රහය : පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

* *සටහන* : සාමාර්ථ්‍යය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

3. දෙපාර්තමේන්තු රෙගුලාසි - I

දෙපාර්තමේන්තු රෙගුලාසි පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :–

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන්ගෙන් සමන්විත පැය 02ක ප්‍රශ්න පත්‍රයකි. සත්ත්ව පනත යටතේ ඇති ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා වූ ආඥා පනත, සත්ත්ව පනත, දෙපාර්තමේන්තු නියෝග හා පශු වෛද්‍ය සේවයට අදාළ චක්‍රලේඛ.

* *සටහන* : සාමාර්ථ්‍යය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

4. දෙපාර්තමේන්තු රෙගුලාසි - II

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන්ගෙන් සමන්විත පැය 03ක ප්‍රශ්න පත්‍රයකි:–

(අ) නිදර්ශක බෙදාහැරීම පශ්චාත් මරණ පරීක්ෂණ ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනාගැනීම් පරීක්ෂණ, බෝවන රෝග, ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව ;

(ආ) කෘත්‍රිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝකිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බීජෞෂනය මඟින් පැටවුන් ලබාගැනීම හා ඇතිදැඩිකිරීම, සත්ත්ව පෝෂණය, පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය

(ඇ) කිරි නිෂ්පාදනය, පැස්චරිකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය, කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම, යොදය වෙන්කිරීම, බටර්, ගිතෙල් හා මී කිරි නිෂ්පාදනය

(ඈ) ඝාතනාගාර සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීම් ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම

* *සටහන* ඃ සාමාර්ථ්‍යය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

ඇමුණුම (ආ)

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ II වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයන්ගෙන් සමන්විත වේ :–

1 කොටස ඃ මෙය විෂය නිර්දේශයේ 2.1, 2.2, 4.1, 4.2, 5.2, 5.8, 6.5, 7.2.1, 8.2, 8.2.2., 8.2.3, 8.3.1, 9.2, 9.4, 9.6, 9.7 කොටස්වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගත හැකිය.

2 කොටස ඃ මෙම විෂය නිර්දේශයේ 1.1.1, 1.1.4, 1.2.1, 3.2, 3.1.1, 3.1.2, 3.2.1, 10.1.1, 10.1.2, 10.1.3, 10.1.4, 10.1.6, 10.2.1, 10.2.8 හා 10.4.1 කොටස්වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගෙන් හා සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන් ගෙන් ලබාගත හැකිය.

| | | |
|---|---|---|
| 3 කොටස ඃ | 1 වැනි පත්‍රය | - ව්‍යාධි විද්‍යාව |
| | 2 වැනි පත්‍රය | - පශු සම්පත් ආර්ථික විද්‍යාව |
| | 3 වැනි පත්‍රය | - පශු මහජන සෞඛ්‍ය |
| | 4 වැනි පත්‍රය | - කෘෂි ව්‍යාප්තිය |
| | 5 වැනි පත්‍රය | - ජාන විද්‍යාව හා අභිජනනය |
| | 6 වැනි පත්‍රය | - සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය |
| | 7 වැනි පත්‍රය | - සත්ත්ව නිවාසකරණය හා කළමනාකරණය |
| | 8 වැනි පත්‍රය | - සත්ත්ව පෝෂණය |
| | 9 වැනි පත්‍රය | - තෘණ හා ගෝචර තෘණ |
| | 10 වැනි පත්‍රය | - ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීව විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව |
| | 11 වැනි පත්‍රය | - ව්‍යවහාරික, වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිත වේදය |

විස්තර පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගත හැකිය.

09-365

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නන්ගේ ප්‍රවීණතා සහතිකය සඳහා වූ පරීක්ෂණය

*ප්‍රවීණතා සහතිකයේ වර්ග* ඃ

(අ) ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරවන්නකුගේ උසස් පන්තියේ ප්‍රවීණතා සහතිකය,

(ආ) ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරවන්නෙකුගේ සාමාන්‍ය පන්තියේ ප්‍රවීණතා සහතිකය,

(ඇ) ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරවන්නෙකුගේ පන්තියේ නවක පන්තිය,

2. *ඇතුළත්වීම සඳහා අවම අවශ්‍යතා* .- විභාගය සඳහා ඉදිරිපත්වන සෑම අපේක්ෂකයකුටම පහත දැක්වෙන අවම මූලික සුදුසුකම් තිබිය යුතුය ඃ-

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අපේක්ෂකයින්ගේ වයස අවුරුදු දාහතර (14) හෝ ඊට වැඩි හෝ විය යුතුය.

3. *පරීක්ෂණයේ පටිපාටි* : (අ) *උසස් පන්තිය.*—පරීක්ෂණය කොටස් දෙකකින් (2) සමන්විත වේ.

1 වැනි කොටස

පරීක්ෂණයකට පෙනී සිටින එක් වරක දී අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට උත්තර ලිවිය යුතුය :—

*I වැනි ප්‍රශ්න පත්‍රය*.- උසස් විදුලි තාක්ෂණය සහ ගුවන් විදුලි සන්නිවේදන (පැය 03);

*II වැනි ප්‍රශ්න පත්‍රය* .- බලපත්‍ර දීමේ කොන්දේසි, මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 02).

*2 වැනි කොටස*

ප්‍රායෝගික මෝස් සංඥා පරීක්ෂණය (විනාඩියකට වචන 05යි).

*(ආ) සාමාන්‍ය පන්තිය.*—එක් වරක දී අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට උත්තර ලිවිය යුතුය.

*I වැනි ප්‍රශ්න පත්‍රය* - ගුවන් විදුලි සන්නිවේදනය සහ විදුලි ශිල්පය පිළිබඳ මූලික කරුණු (පැය 02);

*II වැනි ප්‍රශ්න පත්‍රය* - බලපත්‍ර දීමේ කොන්දේසිය, මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 01);

*(ඇ) නවක පන්තිය* - එක් වරකදී අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට (2) උත්තර ලිවිය යුතුය.

*I වැනි ප්‍රශ්න පත්‍රය* - මූලික විදුලි ශිල්පය, ගුවන් විදුලි සහ විද්‍යුත් සිද්ධාන්ත (පැය 02);

*II වැනි ප්‍රශ්න පත්‍රය* - බලපත්‍ර දීමේ කොන්දේසිය, මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 01).

4. *පරීක්ෂණයේ කොන්දේසි*.- සියලුම වර්ගවල ප්‍රවීණතා සහතික සම්බන්ධයෙන් පහත දැක්වෙන කොන්දේසි බලපානු ඇත. :—

(i) අපේක්ෂකයින් පරීක්ෂණයෙන් සමත්වීමට පරීක්ෂණයේ සියලුම කොටස්වලින් සමත්විය යුතුය.;

(ii) පරීක්‍ෂණයේ දී 1 වැනි කොටස එක් වාරයකින්ම සමත් විය යුතු ය. ;

(iii) පරීක්‍ෂණයේ දී 1 වැනි කොටසින් සමත්වන අපේක්‍ෂකයින්ට පමණක් උසස් පන්තිය වෙනුවෙන් 2 වැනි කොටසට පෙනී සිටීමට (මෝස් පරීක්‍ෂණයට) ඉඩ දෙනු ලැබේ.

5. *පෙනී සිටින මාධ්‍යය.*— විභාගය පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි.

6. *විභාග ගාස්තු .*— මෙම විභාගයට පෙනී සිටීමට ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන්නා වූ ඉල්ලුම්කරු විසින් නිවේදනයේ දක්වා ඇති පරිදි විභාග ගාස්තු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය වේ නම් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අමතන ලෙස අපේක්‍ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

*පරීක්‍ෂණ ගාස්තු.*— ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නමට මුදල් ඇණවුමකින් හෝ ඕනෑම බැංකුවකින් අණකරයක් මගින් ගෙවිය යුතු ය.

ඇතුළත්වීම සඳහා ඉල්ලුම්පත් ලේඛනගතකොට භාරදීමෙන් හෝ අතින් ගෙනැවිත් භාරදීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ එවිය යුතු ය. ඇතුළත්වීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය තැපැල් කළ බවට හෝ භාරදුන් බවට හෝ සාක්ෂි ඉදිරිපත් කළහොත් මිස එය තැපැල් කළ බවට, නැතහොත් භාරදුන් බවට කරන හිමිකම් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සළකා බලනු නොලබන හෙයින් නිළ කුවිතාන්සිය තමන් ළඟ තබාගත යුතු ය.

පරීක්‍ෂණ ගාස්තු ආපසු නොගෙවන අතර, පසු දිනක පවත්වනු ලබන වෙනත් පරීක්‍ෂණයකට පවරනු ලැබිය නොහැකිය. ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස්කර ගන්නා වූ හෝ මොනයම් හේතුවක් නිසා හෝ පරීක්‍ෂණයකට පෙනී සිටීමට නොහැකි වන්නා වූ හෝ ඕනෑම අපේක්ෂකයකු පසුව පවත්වනු ලබන පරීක්‍ෂණ සඳහා අදාළ පරීක්‍ෂණ ගාස්තු ගෙවිය යුතුය.:—

| *පරීක්‍ෂණයේ වර්ගය* | *1 වැනි කොටස සඳහා ගාස්තු රු. ශත* | *2 වැනි කොටස සඳහා ගාස්තු රු. ශත* |
|---|---|---|
| උසස් පන්තිය | 276 | 138 |
| සාමාන්‍ය පන්තිය | 138 | - |
| නවක පන්තිය (අ) | 138 | - |
| නවක පන්තිය (ආ) | 138 | - |

7. *අයදුම්පත් භාරගන්නා අවසාන දිනය.*— සෑම අවුරුද්දකටම තුන් වතාවක් පෙබරවාරි, ජූනි සහ ඔක්තෝබර් මාසවල පරීක්‍ෂණය පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය, විභාග කොමසාරිස්තුමා විසින් දන්වනු ලැබේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබාගත් නිසි ඇතුළත් වීමේ ආකෘතියෙහි ඉල්ලුම්පත් ඇතුළත්වීමේ අවසාන දිනට හෝ ඊට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන්නට සැළැස්විය යුතුය.

විදුලි සංදේශ අධ්‍යක්‍ෂ ජනරාල්, අංක 276, ඇල්විටිගල මාවත, මැනිං ටවුන්, කොළඹ 08.

| *සහතිකයේ වර්ගය* | *ඇතුළත්වීමේ අවසාන දිනය* |
|---|---|
| උසස් පන්තිය<br>සාමාන්‍ය පන්තිය<br>නවක පන්තිය | 2011.09.30 |

8. *සහතික කිරීම.*— පහත සඳහන් අයගෙන් කෙනෙකු විසින් අපේක්‍ෂකයාගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

සාමදාන විනිශ්චයකාරවරයෙක්, දිවුරුම් කොමසාරිස්වරයෙක්, නීතිඥවරයෙක් සහ නොතාරිස්වරයෙක්, යුද්ධ හමුදාවේ හෝ නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරිලත් නිළධරයෙක්, පොලිසියේ රාජ්‍ය නිවේදිත *(ගැසට් කළ)* නිළධරයෙක්, වර්ෂයකට රු. 4,93,920කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන තැනැත්තෙක්.

අනිකුත් සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. *අපේක්‍ෂකයින් හඳුනා ගැනීම.*— පරීක්‍ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීමට අපේක්‍ෂකයකුට/අපේක්‍ෂිකාවකට සිදුවන අතර මේ කාර්යය සඳහා පහත දැක්වෙන ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.:—

(අ) තැපැල්පතිවරයා විසින් නිකුත් කරන ලද වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් ;

(ආ) වලංගු ගමන් බලපත්‍රයක් ;

(ඇ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හඳුනා ගැනීමේ පත්‍රයක්.

1968 අංක 25 දරන විභාග පනතේ විධිවිධානවලට අනුකූලව සියලුම අපේක්ෂකයින් ක්‍රියා කළ යුතු වේ.

මෙම නීති සහ නියෝග යටතේ විධිවිධාන සළසා නොමැති යම් කරුණක් වේ නම් එය විදුලි සංදේශ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි නිරාකරණය වන්නේය.

————————,
විදුලි සංදේශ අධ්‍යක්‍ෂ ජනරාල්.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත,
මැනිං ටවුන්,
කොළඹ 08.

09-213

---

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II පංතියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය - 2011

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II පංතියේ II ශ්‍රේණියේ මෙහි පහත 03 වන ඡේදයේ සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්පත්‍ර පිළියෙල කිරීම හා විභාගයට අයදුම් කිරීම පිළිබඳ උපදෙස් :

2.1 විවෘත තරඟ විභාගයට පෙනී සිටින, සීමිත තරඟ විභාගයට පෙනී සිටින හෝ විවෘත/සීමිත තරඟ විභාග දෙකටම හෝ පෙනී සිටින අයදුම්කරුවන් එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නිවේදනයේ අග සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය උපයෝගි කරගෙන විවෘත තරඟ විභාගය, සීමිත තරඟ විභාගය හෝ සීමිත හා විවෘත තරඟ විභාගය අයදුම්කරන අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍රය සකසාගත යුතු වේ. එය

කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 1/2 x 12(ඒ4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයාගේ අත් අකුරින් ම පැහැදිලිව පිරවිය යුතු ය. ඉල්ලුම්පත්‍රයේ අංක 01 සිට 04 තෙක් කොටස් පළමු වැනි පිටුවට ද ඉතිරිය 02 හා 03 පිටුවලටද වන පරිද්දෙන් ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය.

2.2 ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රද, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රද, ටිපෙක්ස් ගා වෙනස් කළ ඉල්ලුම්පත්‍ර හා සංකේත අංක හා අනෙකුත් තොරතුරු නැවත ලියා ඇති ඉල්ලුම්පත්‍රද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කරනු ලබන ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු විසින් ළඟ තබාගැනීම අනිවාර්ය විය යුතු බව දන්වන අතර, සම්මුඛ පරීක්ෂණයට කැඳවන විට අවශ්‍ය වුවහොත් එය ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

2.3 ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ ඉල්ලුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කිරීම අවශ්‍ය වේ. අයදුම්පත් 2011 ඔක්තෝබර් මස 30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ, "ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට බඳවා ගැනීම සඳහා වූ විවෘත/සීමිත තරඟ විභාගය - 2011" යන්න සඳහන් කර තිබිය යුතු ය.

2.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. සීමිත තරඟ විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය, ඒකකය භාර අධ්‍යක්ෂ/පළාත් සභාවක නම් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් මඟින් එවිය යුතුය.

සටහන -

මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අදාළ නොවන සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන සහ අවිධිමත් ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තුවේ හෝ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ නමට අයදුම්පත් නොඑවිය යුතුය. යම් ඉල්ලුම්පතක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි කිසිවක් සලකා බලනු නොලැබේ.

03. පුරප්පාඩු පවතින තනතුරු, තනතුරුවලට අදාළ අංක සහ ඉල්ලුම් කළ හැකි විභාග :

| තනතුර | තනතුරු අංකය | අයදුම්කළ හැකි විභාගය හා අදාළ අංකය |
|---|---|---|
| කෘෂිකර්ම නිලධාරි | 1 | විවෘත/සීමිත |
| පර්යේෂණ නිලධාරි | 2 | විවෘත/සීමිත |
| කථිකාචාර්ය | 3 | විවෘත/සීමිත |
| කෘෂි ආර්ථික විද්‍යාඥ | 4 | විවෘත/සීමිත |

සටහන —

* විවෘත තරඟ විභාගයේදී උපරිම වශයෙන් තනතුරු 02ක් පමණක් ඉල්ලුම් කළහැකි අතර එය ආදර්ශ ඉල්ලුම්පත්‍රය අනුව සකස්කල එක් ඉල්ලුම්පත්‍රයකින් අයදුම් කළ යුතු ය.

* සීමිත තරඟ විභාගයකදී එක් තනතුරකට පමණක් ඉල්ලුම් කළ හැකි අතර එය ආදර්ශ ඉල්ලුම්පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත්‍රයකින් අයදුම් කළ යුතු ය.

* සීමිත හා විවෘත තරඟ විභාග දෙකටම අයදුම් කරන අපේක්ෂකයින් ඒ සඳහා ආදර්ශ ඉල්ලුම්පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත්‍ර එකකින් අයදුම් කළ යුතු වේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා කොන්දේසි* —

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඉහත සඳහන් තනතුරක් සඳහා බඳවා ගනු ලබන නිලධාරියකු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලටද, නිලධාරිණියක නම් වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලටද දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) විවෘත බඳවා ගැනීම් යටතේ පත් කරනු ලබන නිලධාරීන් වසර 03ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවයේ ස්ථිර කරන ලද නිලධාරියකු පත් කරනු ලැබුවහොත්, එක් වසරකට පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iii) තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

(iv) මෙම පත්වීම් 1619/25 අංක දරන 2009.09.18 හා 1588/17 අංක දරන 2009.02.11 දිනැති *ගැසට් පත්‍රයන්ගෙන්* සංශෝධිත 2002.05.08 වැනි දින අංක 1235/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා එහි මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව සිදුවේ. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10 වන 12 වන ඡේද ද අදාළ වේ.

(v) මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටසේ (II අ) වැනි ඡේදයෙහි දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා පත් කිරීම්වලට අදාළවන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(vi) විවෘත බඳවාගැනීම් යටතේ පත් කරනු ලබන නිලධාරීන්, තනතුරුවල ස්ථිර කිරීමේදී වෙනත් කරුණුවලට අමතරව, ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට ඇතුළත් වූ නිලධාරීන් පරිවාස කාලය ඇතුළත රාජ්‍ය භාෂාවක්, එනම් සිංහල හෝ දෙමළ භාෂා ප්‍රවීණතාවයක් ලබාගත යුතු ය. රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කරවා ගැනීම සඳහා, අ. පො. ස. (සා. පෙ.) විභාගයේ සිංහල/දෙමළ භාෂා විෂයය සමත්ව ඇති බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද විභාග ප්‍රතිඵල සටහනේ සහතික කළ පිටපතක් හෝ විභාග සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.

(vii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සිංහල හා දෙමළ යන භාෂා දෙකම රාජ්‍ය භාෂා වේ. එබැවින් රජයේ සේවකයන්ට එම භාෂා දෙකෙන්ම කටයුතු කිරීමට හැකිවන සේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව පත්වීම් දින සිට වසර 05ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

05. *ව්‍යුහය හා වාර්ෂික වැටුප් පරිමාණය* —

මෙම තනතුරුවලට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව හිමි ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත සඳහන් පරිදි වේ. :-

SL-1-22,935-645x10-790x8-1050x17-53,555

බඳවාගනු ලබන්නේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II පංතියේ II ශ්‍රේණියට ය.

II පංතියේ II ශ්‍රේණියේ ආරම්භක පියවර - රු. 22,935/- වේ.

අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත කාලයේදී සමත් වුවහොත් වැටුප් වර්ධක ගෙවනු ලැබේ.

06. *බඳවා ගැනීමේ ක්‍රමය*

විභාග කොමසාරිස් ජනරාල් විසින් අපේක්ෂකයින් වෙනුවෙන් විවෘත හා සීමිත තරග විභාග දෙකක් පවත්වනු ලැබේ. එහෙත් විවෘත හා සීමිත අපේක්ෂකයන් 14(1) ඡේදයේ සඳහන් පළමුවන (පොදු) ප්‍රශ්න පත්‍රයට සහ 14(2) ඡේදයේ සඳහන් විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍ර අතරින් එක් ප්‍රශ්න පත්‍රයකට අනිවාර්යයෙන් ම පෙනී සිටිය යුතු ය. විවෘත හා සීමිත අපේක්ෂකයින් වෙන වෙනම විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍ර වලට පෙනී සිටිය යුතු ය. එකී විභාගයේ ප්‍රතිඵල මත මෙහි පහත දක්වා ඇති විධිවිධානවලට අනුකූලව බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

07. *විවෘත තරග විභාගය* —

07.1 *බඳවා ගැනීමේ ක්‍රමය* :

(අ) කරීකාචාර්ය තනතුරට පත් කරනු ලබන්නේ විවෘත බඳවා ගැනීම් තුළින් පමණි. කෘෂිආර්ථික විද්‍යාඥ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60%ක් ද, පර්යේෂණ නිලධාරි තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60%ක්ද, කෘෂිකර්ම නිලධාරි තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 33 1/3%ක් ද විවෘත බඳවා ගැනීම් මඟින් පුරවනු ලැබේ. එහෙත් මෙකී තනතුරුවලට සීමිත බඳවා ගැනීම් තුළින් පත් කිරීම සඳහා 08 වන ඡේදය යටතේ වෙන් කර ඇති ප්‍රතිශතයනට සරිලන සංඛ්‍යාවක් එසේ පත්කර ගැනීමට නොහැකි වන අවස්ථාවලදී, ඉතිරි වන පුරප්පාඩු සංඛ්‍යාවද විවෘත බඳවා ගැනීම් තුළින් පුරවනු ලැබේ.

(ආ) එක් අයදුම්කරුවකුට ඉල්ලුම් කිරීමට අවකාශ ඇත්තේ සිය මනාපය පරිදි උපරිම වශයෙන් 03 වන ඡේදයේ දක්වා ඇති තනතුරු අතුරින් දෙකක් සඳහා පමණි.

(ඇ) අදාළ තනතුරු වෙනුවෙන් අයදුම්කරුවන්ගේ විෂයානුබද්ධ දැනුම මැන බැලීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වැනි උපලේඛනයේ 2 වැනි පත්‍රය යටතේ නියම කර ඇති ප්‍රශ්න පත්‍රයට ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව උපරිම අනු පිළිවෙල අනුව වෙන වෙනම පෙළගස්වා ලැයිස්තු ගත කරන අතර එකී ලකුණු සංඛ්‍යාවේ හා පොදු ප්‍රශ්න පත්‍රයට ලබාගන්නා ලකුණු සංඛ්‍යාවේ එකතුවේ අනුපිළිවෙල පදනම් කර ගනිමින් අයදුම්පතේ සඳහන් මනාපයන්ද, සැලකිල්ලට ගෙන, නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

07.2 *වෙනත් සුදුසුකම්* :

(අ) සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර උපරිම වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. එහෙත් ඒ දිනට රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අවුරුදු 40ක් වේ.

(ඇ) එක් අයදුම්කරුවකුට අවස්ථා තුනක් පමණක් විවෘත විභාගයට පෙනී සිටිය හැක.

(ඈ) මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර, ඒ බව වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් සනාථ කළ යුතු ය.

07.3 *අධ්‍යාපනික සුදුසුකම්* :

මෙහි පහත I හා II යටතේ දැක්වෙන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II පංතියේ II ශ්‍රේණියේ උපලේඛනගත තනතුරු සඳහා අයදුම් කිරීම පිණිස පහත දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(i) කෘෂිකර්ම නිලධාරි, කරීකාචාර්ය, විෂයානුගත විශේෂඥ සහ කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරු

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය.

හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තුන් අවුරුදු කෘෂිකර්ම විද්‍යා උපාධිය සහ නිබන්ධනයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් දෑ අවුරුදු පශ්චාත් උපාධියක් ලබා තිබීම ;

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී කෘෂිකාර්මික තාක්ෂණ කළමනාකරණය පිළිබඳ සිව් අවුරුදු උපාධිය ;

(ii) *පර්යේෂණ නිලධාරි තනතුර*

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය ;

හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විශේෂ විද්‍යා උපාධිය ;

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී කෘෂිකාර්මික තාක්ෂණ කළමනාකරණය පිළිබඳ සිව් අවුරුදු උපාධිය;

හෝ

(ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තුන් අවුරුදු කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යා උපාධිය සමඟ පහත සඳහන් විෂයයන්ගෙන් කවර හෝ එක් විෂයක් පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයකින් නිබන්ධනයක් ද සහිතව දෑ අවුරුදු පශ්චාත් උපාධියක් ලබා තිබීම. අදාළ විෂයයන් සටහන 1 යටතේ දක්වා ඇත.

*සටහන* I : —

(i) ව්‍යාධිවේදය
(ii) කීට විද්‍යාව
(iii) පාංශු විද්‍යාව
(iv) ක්ෂුද්‍ර ජීව විද්‍යාව
(v) කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව
(vi) සංඛ්‍යානය
(vii) පරිගණක විද්‍යාව
(viii) ජෛව විවිධත්වය
(ix) පාරිසරික විද්‍යාව
(x) ආහාර තාක්ෂණය
(xi) භූ විද්‍යාව
(xii) ජාන සංඛ්‍යාව
(xiii) ශාඛ විද්‍යාව
(xiv) කෘෂිකර්ම විද්‍යාව
(xv) ශෂ්‍ය විද්‍යාව
(xvi) පැලෑටි අභිජනනය
(xvii) පළිබෝධනාශක රසායන විද්‍යාව
(xviii) විෂ විද්‍යාව

*සටහන* II :– විවෘත බඳවා ගැනීම් සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාගයට ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර මූලික අධ්‍යාපන සුදුසුකම් ලෙසට නියම කර ඇති උපාධිය හෝ පශ්චාත් උපාධි සම්බන්ධයෙන් වූ පූර්ණ සුදුසුකම් ලබාගෙන තිබිය යුතු ය. මේ සඳහා උපාධි සහතිකයේ/පශ්චාත් උපාධි සහතිකයේ වලංගු දිනය, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.

*සටහන* III :– නිර්දේශිත සුදුසුකම් සම්පූර්ණ කිරීමට අදාළව ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර වලංගු නොවේ.

08. *සීමිත තරග විභාගය :-*

කෘෂිකර්ම නිලධාරී තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 66 2/3%ක්, පර්යේෂණ නිලධාරී තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40%ක් සහ කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40%ක් ද, විභාගයට පෙනී සිටින අවස්ථාවේදී අයදුම්කරුවන් දරන ලද තනතුරු සඳහා වෙන් කරනු ලබන පහත වගුවේ දැක්වෙන ප්‍රතිශතයනට සහ පහත 08.2 හි විධිවිධානවලට අනුකූලව පුරවනු ලැබේ. කෙසේ වුවද එකී ප්‍රතිශතයනට සරිලන සංඛ්‍යාවක් සීමිත බඳවා ගැනීම් යටතේ පත් කර ගැනීමට නොහැකි අවස්ථාවලදී, ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව විවෘත බඳවා ගැනීම්වලින් පුරවනු ලැබේ.

| *උපලේඛනගත තනතුරු* | *විභාගයට පෙනී සිටින ලද අවස්ථාවේදී දරන ලද තනතුර* | | |
|---|---|---|---|
| | *කෘෂිකර්ම උපදේශක, උද්‍යාන සහකාර, කෘෂි මෙහෙයුම් නිලධාරී, වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)* | *පර්යේෂණ සහකාර, පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරී, කෘෂි මෙහෙයුම් නිලධාරී, වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)* | *ආර්ථික විද්‍යාඥ සහකාර, කෘෂි මෙහෙයුම් නිලධාරී, වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)* |
| කෘෂිකර්ම නිලධාරී | 66 2/3% | - | - |
| පර්යේෂණ නිලධාරී | - | 40% | - |
| කෘෂි ආර්ථික විද්‍යාඥ | - | - | 40% |

08.1 *සුදුසුකම් ලබන නිලධාරීන් :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට, පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබෙන,

(*අ*) ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ විශේෂ පංතියේ කෘෂිකර්ම උපදේශක, පර්යේෂණ සහකාර, පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරී තනතුරු දරන නිලධාරීහු ;

(*ආ*) ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ I වැනි පංතියේ අවම වශයෙන් වසර 04ක සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබෙන කෘෂිකර්ම උපදේශක, පර්යේෂණ සහකාර, පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරී තනතුරු දරන නිලධාරීහු;

(*ඇ*) වසර 05ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂි මෙහෙයුම් නිලධාරී හා වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) තනතුරු දරන නිලධාරීහු (මෙම තනතුරක් දරන සුදුසුකම් ලත් නිලධාරියකුට අයදුම් කළ හැක්කේ ඉහත වගුවෙහි දක්වා ඇති උපලේඛනගත තනතුරු 3 අතරින් එකකට පමණි.) ;

(*ඇ*) වසර 05ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආර්ථික විද්‍යාඥ සහකාර තනතුරු දරන නිලධාරීහු ;

(*ඉ*) වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති උද්‍යාන සහකාර තනතුරු දරන නිලධාරීහු.

(*ඊ*) වසර 05ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යා උපාධියක් සහිත කෘෂිකර්ම උපදේශක, උද්‍යාන සහකාර, පර්යේෂණ සහකාර, පාංශු සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරීහු.

*සටහන* 1 .– අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව, ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් අතීතයට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලබන සහන හෝ උසස්වීම්, විභාගයට පෙනී සිටීම සඳහා නියමිත සුදුසුකම් සපුරාලීමක් ලෙස සලකා බලනු නොලැබේ.

08.2 *බඳවා ගැනීමේ ක්‍රමය :*

(*අ*) ඉහත 08 වැනි ඡේදයේ සඳහන් එක් එක් තනතුරු සඳහා මෙම නිවේදනයේ 14 වැනි ඡේදයේ නියම කර ඇති පොදු ප්‍රශ්න පත්‍රයට සහ අදාළ වන පරිදි විෂයානුබද්ධ විෂයයට නියමිත ප්‍රශ්න පත්‍රයකටද අයදුම්කරුවන් පිළිතුරු සැපයිය යුතු ය ;

(*ආ*) නියමිත සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම 40% හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ ;

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයේදී ජ්‍යෙෂ්ඨතාව වෙනුවෙන් ලබාගත් ලකුණු, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පසු එම ලකුණු හා ලිඛිත විභාගයේ ලකුණු එකතු කිරීමෙන් එක් එක් තනතුරක් සඳහා වන සීමිත විභාගයේ අවසාන ප්‍රමුඛතා ලේඛනය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සකස් කර කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදෙනු ඇත. එම ප්‍රමුඛතා ලේඛනයේ උපරිම අනුපිළිවෙල මත 08 වැනි ඡේදයේ විධිවිධානවලට අනුකූලව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

09. *විභාගය පවත්වන ස්ථානය හා දිනය .–*

මෙම විභාගය කොළඹ දී පමණක් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2011 නොවැම්බර් මස පවත්වනු ලැබේ.

10. *විභාග ගාස්තු .–*

* එක් තනතුරකට ඉල්ලුම්කරන්නේ නම් විභාග ගාස්තුව රුපියල් 800 කි.
* තනතුරු දෙකකටම නම් රුපියල් 1,000 කි.
* සීමිත හා විවෘත තරග විභාග දෙකටම ඉල්ලුම්කරන්නේ නම් විභාග ගාස්තුව රු. 1,200 කි.

එම ගාස්තුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් පේරාදෙණිය මහජන බැංකුවේ ඇති අංක 057-100179027204 දරන ගිණුමට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකුවකින් ගෙවිය හැක. ඒ සඳහා ඕනෑම දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් ලබාගන්නා ලද පොදු 118 දරන ආකෘති පත්‍රයේ (පී. අයි. වී.) ලැබීම් ශීර්ෂය ලෙස 15/140 යොදා ඉතිරි විස්තරද සම්පූර්ණ කොට බැංකුව වෙත භාරදී බැංකුවෙන් ඔබ වෙත ලබාදෙන ලදුපත හා බැංකුවේ නිල මුද්‍රාව සහිත ඉහත පී. අයි. වී. ආකෘති පත්‍රයද ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවීමට කටයුතු කරන්න. තවද ලදුපතෙහි හා පී. අයි. වී. පත්‍රයෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

11. *විභාගයට පෙනී සිටීම .–*

(අ) ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම පුද්ගලයින්ට, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත් නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශපත් නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක්ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත ;

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී තමාට හිමි විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන් ම එම ශාලාවේදී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාරදිය යුතු ය. තමාට පෙනී සිටීමට හිමි විභාගයේ නියමිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සෑම අපේක්ෂකයකුගේම වගකීමකි. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත ;

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු/ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. *අපේක්ෂකයාගේ අනන්‍යතාව .–*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත (වලංගු) ;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13. *විභාග ක්‍රමය .–*

(i) *විභාගය පැවැත්වෙන ආකාරය :*

විභාගය කොටස් දෙකකින් පැවැත්වේ. සියලුම තනතුරු සඳහා විභාගයට ඉල්ලුම්කරන ලද සීමිත/විවෘත සියලු අපේක්ෂකයින්ට පොදු ප්‍රශ්න පත්‍රය එකම දිනක පැවැත්වේ. එම පොදු ප්‍රශ්න පත්‍රය සඳහා 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්ට විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍ර සඳහා දෙවන අදියරේදී විභාගය පැවැත්වේ.

(ii) *විභාග මාධ්‍යය :*

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ ;

(iii) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පමණක් පිළිතුරු ලිවිය යුතු ය.

14. *තරග විභාග පටිපාටිය හා අදාළ විෂය නිර්දේශය .–*

ඉහත 06 වැනි ඡේදයේ දක්වා ඇති පරිදි සියලුම අයදුම්කරුවන් මෙහි මතු දැක්වෙන විෂය නිර්දේශයනට අනුකූලව 1 වැනි සහ 2 වැනි ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතු ය.

(i) 1 වැනි ප්‍රශ්න පත්‍රය : පොදු ප්‍රශ්න පත්‍රය :

භාෂාමය, ගණිතමය හා තර්කන හැකියාව මැන බැලීම සඳහා ප්‍රශ්න ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 1 1/4 කි. මුළු ලකුණු සංඛ්‍යාව 150කි. මෙම ප්‍රශ්න පත්‍රයට සියලුම අපේක්ෂකයින් පෙනී සිටීම අනිවාර්ය වේ.

(ii) 2 වැනි ප්‍රශ්න පත්‍රය : විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍ර :

මෙහි නියම කර ඇති විෂයය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලීම සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකි. එක් එක් අයදුම්කරුවකු විසින් තමන් ඉල්ලුම් කරනු ලබන තනතුරට හෝ තනතුරුවලට අදාළ වන පරිදි පළමුවැනි උපලේඛනයේ සඳහන් ප්‍රශ්න පත්‍ර අතුරින් තෝරාගනු ලබන ප්‍රශ්න පත්‍ර එකකට හෝ දෙකකට පෙනී සිටිය යුතු ය. මෙම ප්‍රශ්න පත්‍ර බහුවරණ සහ කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න වලින් සකස් කෙරේ. කාලය පැය 2ක් වන අතර, මුළු ලකුණු සංඛ්‍යාව 150ක් වේ.

එක් එක් තනතුරට අදාළ විෂයය නිර්දේශයන් පළමුවැනි උපලේඛනයේ දැක්වේ.

15. සම්මුඛ පරීක්‍ෂණය :

සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. එහි සභාපති වශයෙන් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් කටයුතු කරන අතර, කෘෂිකර්මය හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ නියෝජිතයකු බැගින් සහ අදාළ වන පරිදි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂවරුන් දෙදෙනකු අනෙකුත් සාමාජිකයින් වශයෙන් කටයුතු කරනු ඇත.

(i) ඉහත 07.1(ඇ) හා 08.2 (ආ) උප ඡේදයන්වල විධිවිධානවලට අනුකූලව විවෘත හා සීමිත අයදුම්කරුවන් සම්මුඛ පරීක්‍ෂණයට භාජනය කෙරේ. එහිදී අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ ලියවිලි සහ සහතික පත් පරීක්‍ෂා කරනු ලැබේ.

(ii) අයදුම්කරුවකු විවෘත තරග විභාගය සඳහා උපලේඛනගත තනතුරු දෙකකට ඉල්ලුම් කොට, එකී තනතුරු දෙකටම තෝරාගනු ලැබීම සඳහා ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන ඇති විටක අපේක්‍ෂකයාගේ මනාපය හා පුරප්පාඩු සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිතව බඳවා ගැනීම සිදු කරනු ඇත.

(iii) සීමිත අයදුම්කරුවන් සඳහා පමණක් ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

*සටහන 1 - ජ්‍යෙෂ්ඨතාව සඳහා ලකුණුදීමේ ක්‍රමය :*

අයදුම්කරුවකු නියමිත සුදුසුකම් සපුරාලන ලද දින සිට අයදුම්පත් භාරගන්නා අවසාන දින දක්වා සේවය කළ සක්‍රිය කාලසීමාව පමණක් ජ්‍යෙෂ්ඨතාවට ලකුණුදීම සඳහා ගණන් ගනු ලැබේ. ලකුණු 30ක උපරිමයකට යටත්ව එම සක්‍රිය සේවා කාලයට ගැනෙන එක් වසරකට ලකුණු 02ක් බැගින්ද, දින 180 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් වෙනුවෙන් ලකුණු 01 බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.

සටහන 2 - මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවේ II වැනි පංතියේ "අ" ඛණ්ඩයේ වසර 04ක සක්‍රිය සතුටුදායක සේවා කාලයකින් පසුව සම්පූර්ණ කර ඇති සක්‍රිය සතුටුදායක සේවා කාලයක් වෙනුවෙන් ද, ජ්‍යෙෂ්ඨතාව සඳහාවූ ලකුණු ප්‍රදානය කිරීම සිදු කෙරේ.

16. ඉල්ලුම් පත්‍රයට සහතික කිසිවක් අමුණා නොඑවිය යුතුය. අයදුම්කරුවන් සම්මුඛ පරීක්‍ෂණයට භාජනය කරන අවස්ථාවේදී පමණක් ඔවුන් තම අයදුම් පත්‍රයෙහි සඳහන් කර ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික වල මුල් ලේඛන ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.

17. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්‍ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්‍ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්‍ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇති බව හෝ පත්වීම් දීමට පසුව හෙළි වුවහොත් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට හේතුවනු ඇත.

18. තරග විභාග සම්බන්ධව වූ අයදුම්පත්වල හා තෝරාගැනීමේ ක්‍රමය සම්බන්ධව නොපැහැදිලි තත්ත්වයන් මතු වුවහොත් ඒ ගැන අවසන් තීරණ පත්වීම් බලධාරියා විසින් ගනු ඇත.

19. පවතින පුරප්පාඩු සියල්ල හෝ කොටසක් හෝ පිරවීම ගැන අවසන් තීරණය ගනුයේ පත්වීම් බලධරයා විසින්ය.

20. පාඨ අතර යම් අපැහැදිලිතාවයක් මතුවූ විට සිංහල පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

අංක 177, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

2011 අගෝස්තු මස 10 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II පංතියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2011

Open/Limited Competitive Examination for Recruitment to the Class II, Grade II of The Sri Lanka Agricultural Service - 2011

| විභාග අංකය | |
|---|---|

ඉල්ලුම් කරන විභාගයට අදාල තනතුර/තනතුරු
(ගැසට් නිවේදනයේ 03, 07 සහ 08 වැනි ඡේද බලන්න)

| සීමිත තරග විභාගයට අයදුම් කරන තනතුර හා අංකය | | විවෘත තරග විභාගයට අයදුම් කරන තනතුර හා අංකය | |
|---|---|---|---|
| තනතුර | *තනතුරු අංකය* | තනතුරු | *තනතුරු අංකය* |
| 1 | | 1 | |
| | | 2 | |

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (ගැසට් නිවේදනයේ 13. *(ii)* ඡේදය බලන්න - අදාළ අංකය කොටුව තුළ ලියන්න.
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :
(*අ*) සිංහලෙන්/දෙමළෙන් :————.
(*ආ*) ඉංග්‍රීසියෙන් (උදා : *Jayantha* M. A. C.) :————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :
(*අ*) සිංහලෙන්/දෙමළෙන් :————.
(*ආ*) ඉංග්‍රීසියෙන් :————.

(iii) උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(iv) ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවු. | | | මාස | | | දින | | |

02. (i) ස්ථිර පදිංචි ලිපිනය : (විභාග ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කෙරේ.)
(අ) සිංහලෙන්/දෙමළෙන් :————.
(ආ) ඉංග්‍රීසියෙන් :————.
(ii) රාජකාරි ලිපිනය : (රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙකු නම් ඔහුගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වුණි නම් එය වහාම දැන්විය යුතුය.)
(අ) සිංහලෙන්/දෙමළෙන් :————.
(ආ) ඉංග්‍රීසියෙන් :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (ඉදිරි කොටුවෙහි නියමිත අංකය යොදන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

04. (i) ජාතික හැඳුනුම්පත් අංකය :

(ii) දුරකථන අංකය :

05. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග : (ඉදිරි කොටුවෙහි නියමිත වචනය යොදන්න.) ඔව්/නැත

06. අධ්‍යාපන සුදුසුකම් :

6.1 උපාධි සුදුසුකම් :

| *ලබා ඇති උපාධිය/උපාධි*<br>*1. සිව් අවුරුදු කෘෂි විද්‍යා*<br>*2. තුන් අවුරුදු කෘෂි විද්‍යා*<br>*3. සිව් අවුරුදු විද්‍යා*<br>*4. තුන් අවුරුදු විද්‍යා*<br>*5. දැවුරුදු පශ්චාත් උපාධිය (නිබන්ධනයක් සහිත)* | *අධ්‍යයන වර්ෂය හා එම උපාධිය වලංගු වන දිනය (පැහැදිලිව දක්වන්න)* | *විශ්ව විද්‍යාලය/විද්‍යාල* | *විෂයයන්* | *සාමාර්ථය* | *භාෂා මාධ්‍යය* |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |

6.2 දැ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව :

| *කෘෂිකර්ම ඩිප්ලෝමාවේ අධ්‍යයන වර්ෂය හා එම ඩිප්ලෝමාව වලංගු වන දිනය(පැහැදිලිවදක්වන්න)* | *කෘෂිකර්ම විද්‍යාලය/ආයතනය* | *සාමාර්ථය* | *භාෂා මාධ්‍යය* |
|---|---|---|---|
| | | | |

07. මීට පෙර ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට බඳවාගැනීමේ විවෘත තරග විභාගවලට පෙනී සිටියේද යන්න? පෙනී සිටියේ නම් පෙනී සිටි වර්ෂය/වර්ෂයන් සඳහන් කරන්න.

08. සීමිත තරග විභාග අපේක්ෂකයින් නිවේදනයේ 08 වැනි ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලබා ඇති සුදුසුකම් මෙහි පහත දක්වන්න.

| වර්තමාන තනතුර<br>1. පර්යේෂණ සහකාර<br>2. පස් සමීක්ෂක නිලධාරි<br>3. ඉඩම් ඇගයීමේ නිලධාරි<br>4. කෘෂිකර්ම උපදේශක<br>5. උද්‍යාන සහකාර<br>6. ආර්ථික විද්‍යාඥ සහකාර<br>7. කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි<br>8. වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) | සීමිත බඳවා ගැනීම් යටතේ බඳවා ගැනීමට සුදුසුකම් ලබන තනතුර<br>1. පර්යේෂණ නිලධාරි<br>2. කෘෂිකර්ම නිලධාරි<br>3. කෘෂි ආර්ථික විද්‍යාඥ | කෘෂිකර්ම නිලධාරි, පර්යේෂණ නිලධාරි හෝ කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුරට ඉල්ලුම් කිරීමට සුදුසුකම් සම්පූර්ණ කරන දිනය (*ගැසට් නිවේදනයේ 8.1 හි සුදුසුකම් සම්පූර්ණ කරන දිනය.*) |
|---|---|---|
| | | |

09. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වරදකරුව ඇද්ද? ඔව්/නැත.
ඔව් නම් විස්තර සපයන්න. :————.

10. විභාග ගාස්තු වශයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුව වෙත ගෙවන ලද රු. 800 රු. 1,000 රු. 1,200ට අදාල ලදුපත හා බැංකුව විසින් සිය නිල මුද්‍රාව සහිතව ඔබ වෙත දෙනු ලබන පී. අයි. වී. ආකෘති පත්‍ර (පොදු 118) ගැලවීමට හැකි අයුරින් එක් දාරයකින් මෙහි ඇමිණිය යුතුය. (මුදල් ගෙවන ලද බැංකු ශාඛාවේ නම, මුදල හා දිනය මෙහි සඳහන් කරන්න.)

| *දිනය* | *මුදල් ගෙවන ලද බැංකු ශාඛාවේ නම* | *මුදල* |
|---|---|---|
| | | |

ලදුපත හා පී. අයි. වී. ආකෘති පත්‍රය නොගැලවෙන සේ ඉහල දාරයෙන් මෙහි අලවන්න.

11. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි හෝ බව මා තෝරා ගැනීමට පෙර දැනගත හොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට යටත් බවත්, තෝරාගැනීමෙන් පසුව ඒ බව දැනගතහොත් මාගේ පත්වීම වහාම අවලංගු වන බවත්, අයදුම්පත සම්පූර්ණ කිරීමේදී යම් ප්‍රමාදයක් සිදුව ඇත්නම් එහි වගකීම මා වෙත පැවරෙන බවත්, මම හොඳාකාරව දැන සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති වලට මම එකඟ වෙමි. තවද මා ඉදිරිපත් කර ඇත්තේ එක් ඉල්ලුම්පත්‍රයක් බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරන්නේ නම් පමණක් පහත සඳහන් සහතිකය සමග සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ පළාත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ හෝ පළාත් කෘෂිකර්ම විෂයභාර ලේකම්ගේ මාර්ගයෙන් අයදුම්පත ඉදිරිපත් කළයුතුය.)

### අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා බවත්, ඔහු/ඇය මා ඉදිරියේ දී ........................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි. ........................ මහතා/මහත්මිය/මෙනවිය ............................. දෙපාර්තමේන්තුවේ/ පළාත් සභාවේ ..................... තනතුරේ ..................... දින සිට සේවයේ නියුතු බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, පූර්වාසන්න වසර 05ක කාලය තුලදී සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, විනය ක්‍රියා මාර්ගයක් ඇති/නැති බවත්, නියමිත ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි. ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් මුදාහල හැකිය/නොහැකිය.

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/පළාත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා/පළාත් කෘෂිකර්ම විෂයභාර ලේකම්ගේ සහතිකය

................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ ........................ ක ලෙස සේවයේ නියුතු බවද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, මෙම තනතුරට අදාල 08.1 ඡේදයේ සුදුසුකම් සියල්ලක් සපුරා ඇති බැවින් ඔහු/ඇය මෙම තනතුරට අයදුම් කිරීමට සෑම අතින්ම සුදුසුකම් සපුරන බව ද, විනයානුකූල ක්‍රියා මාර්ගයක් ඇති/නැති බවත් සහතික කරමි.

————————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/පළාත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ/පළාත් සභා කෘෂිකර්ම විෂයභාර ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

*පළමුවන උපලේඛනය*

එක් එක් තනතුරට අදාළ විෂය නිර්දේශයන් පහත දැක්වේ.

I. පර්යේෂණ නිලධාරි තනතුර සඳහා ප්‍රශ්න පත්‍රය ඃ
අයදුම්කරුවන්ගේ මනාපය පරිදි පහත (අ) සහ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් එක් කොටසක් සඳහා පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

(අ) කොටස ඃ

01. ***කෘෂිකාර්මික උද්භිද විද්‍යාව*** :
බෝගවල වර්ගීකරණ මූලධර්ම, බෝග වර්ධන හා කායික විද්‍යාත්මක මූලධර්ම

02. ***ප්‍රවේනි විද්‍යාව හා ශාබා අභිජනනය*** :
මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේනි විද්‍යාව, විකෘති, අණුක ප්‍රවේනිය, සෛල ප්‍රවේනි විද්‍යාව, ප්‍රමාණාත්මක ප්‍රවේනි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්ව, පරාගන සහ අභිජනන සංකල්ප, විසංයෝගීතාව, මහා සහ නුමුහුන් පේළි වර්ණය බහුලව භාවිත වන අභිජනන ක්‍රම හා වර්තමාන නැඹුරුව.

03. ***ශාක ව්‍යාධි විද්‍යාව*** :
ව්‍යාධිජනක ජීවී බාණ්ඩ, ආසාදන ඒවාට පැළෑටි දක්වන සංවේදීතාව, ආසාදන ආකාරය, මේවා පාලනයේ මූලධර්ම, ශාබ ව්‍යාධි විද්‍යාවේ සහ රෝග පාලනය පිළිබඳව වර්තමාන නැඹුරුව, රෝග විනිශ්චය කිරීමේ තාක්ෂණ ක්‍රම, රෝග ලක්‍ෂණ විද්‍යාව, කොක්ගේ උපකල්පිතය, රෝග විනිශ්චයේ නව තාක්‍ෂණ ක්‍රම (ELISA) හා වර්තමාන නැඹුරුව.

04. ***කීට විද්‍යාවේ මූලධර්ම*** :
සත්ත්ව වර්ගීකරණයේ මූලධර්ම, කෘමින් වර්ග විලාසයන්, ජීවන තොරතුරු සහ හානි, කෘමි හානිවල ආර්ථික වැදගත්කම, කෘමි ගහණ හා හානි තක්සේරු කිරීම

05. ***බීජ තාක්‍ෂණය*** :
බීජ කායික විද්‍යාව, ව්‍යුහ, සුප්තතාව, පුරෝහනය, ජීව්‍යතාව, බීජ පරීක්‍ෂණය සහ පාරිශුද්ධතාව සඳහා පරීක්‍ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථා, බීජ සහතික කිරීම. බීජ ගබඩා කිරීම

06. ***පටක විද්‍යාව*** :
මූලධර්ම, පටක විද්‍යාව පහසුකම් හා අවශ්‍යතාව, මාධ්‍යයන්, පටක විද්‍යා රෝපණ ක්‍රම, භාවිතා කරන අවස්ථා, ප්‍රාක්ප්ලාස්මීය රෝපනය, විකෘති බිහිවීම, කළල බේරාගැනීම, නලස්ථ සංසේචනය, ජානමය පරිනාමය, ශාක සංරක්‍ෂණය.

07. ***කෘෂිකාර්මික රසායන විද්‍යාව*** :

ජීව රසායන විද්‍යාවේ (Bio Chemistry) මූලධර්ම හා කෘෂිකර්මාන්තයේදී ජීව රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, ආහාර රසායන විද්‍යාවේ මූලධර්ම (Food Chemistry) හා කෘෂිකර්මාන්තයේ දී ආහාර රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ (Analytical Chemistry) මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්,

හෝ

(ආ) කොටස

01. ***ශෂ්‍ය විද්‍යාව*** :
කෘෂි දේශගුණික විද්‍යාව, පරිසර විද්‍යාව, භූමි සංවර්ධනය, භූමි සැකසීම, බෝග වර්ධනයේ හා කායික විද්‍යාවේ මූලධර්ම, භෝග වර්ධන මිණුම්, අස්වනු පරාමිති, පොහොර නිර්දේශ හා කාර්යක්‍ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව හා පාලනය, ජල සම්පාදන ක්‍රමවල මූලධර්ම, භෝග පාංශු හා ජල සම්බන්ධතාවයේ මූලධර්ම.

02. ***භෝග විද්‍යාව*** :
වී, උස්බිම් ධාන්‍ය, මාෂ භෝග, අල බෝග හා අනෙකුත් ක්ෂේත්‍ර භෝගවල කායික විද්‍යාව, වර්ධනය ප්‍රචාරණ ක්‍රම, රෝපන ක්‍රම, භෝග පාලනයේ භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක ක්‍රම, විද්‍යාත්මක තෘණ බිම ඇතිකිරීම හා ඒවා පාලනය, දැව නිෂ්පාදනය හා පළතුරු නිෂ්පාදන මූලධර්ම

03. ***පාංශු විද්‍යාව*** :
පස, නිර්මාණය, පසක භෞතික හා රසායනික ගති ලක්‍ෂණ බෝග වගාවට අදාළව පසෙහි ඇති ගැටලු, පසෙහි සාරවත් බව

පාලනය, ජල පෝෂක පාලනය, පැළෑටි පෝෂණය, පාංශු වර්ගීකරණ මූලධර්ම

04. ***ප්‍රවේනි විද්‍යාව හා පැළෑටි අභිජනනය*** :
මූලධර්ම, මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේනි විද්‍යාව, විකෘති, අණුක ප්‍රවේනි විද්‍යාව, සෛල ප්‍රවේනි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය.

05. *පැළෑටි ව්‍යාධි විද්‍යාව* :
පැළෑටි ආසාදනය, ආසාදනවලට පැළෑටිවල සංවේදීතාව, ජෛව පාලනය, රෝග පාලනයේ නූතන ප්‍රවණතා.

06. ***කීට විද්‍යා මූලධර්ම*** :
(අ) ප්‍රශ්න පත්‍රයේ 04 උපඡේදය යටතේ දක්වා ඇත.

07. ක්ෂේත්‍ර පර්යේෂණ මූලධර්ම හා සංඛ්‍යාත මූලධර්මයන් (Statistical Principles) සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි වැදගත් සංඛ්‍යා ලේඛන පිළිබඳ දැනුම.

08. ***කීට විද්‍යාව*** :
කෘෂිකර්මයේ දී ආර්ථික වශයෙන් වැදගත් කෘමීන්, ඔවුන්ගේ වර්ගීකරණය, බාහිර හා අභ්‍යන්තර ගති ලක්ෂණ, විවිධ පද්ධතිවල නිර්මාණය හා ඒවායින් කෙරෙන කාර්යයන්, පළිබෝධ පාලනය, පළිබෝධ හානිවල වැදගත්කම, පළිබෝධකයින් හඳුනාගැනීම, ඔවුන්ගේ හානිය හා මර්ධනය, ඒකාබද්ධ පළිබෝධ පාලනය.

09. ***ක්ෂුද්‍ර ජෛව විද්‍යාව*** :
ක්ෂුද්‍ර ජීවීන් හා කෘෂිකාර්මික පරිසරය, ජෛව තාක්ෂණය, කෘෂිකර්මය සඳහා භාවිතය, පාංශු ජීවීන් හා කෘෂිකර්මයට ඔවුන්ගේ බලපෑම්.

10 ***ජිවමිතිය හා ව්‍යවහාරික යෙදවුම් සංඛ්‍යානය*** :

සංඛ්‍යානය සම්බන්ධ මූලික දැනුම, කෘෂිකාර්මික පර්යේෂණ, සැළසුම් විශ්ලේෂණ, දත්තයන් ලබාගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

*සටහන* ඃ විවෘත සහ සීමිත බඳවා ගැනීම් තුළින් පර්යේෂණ නිලධාරි තනතුරුවලට අයදුම් කරනු ලබන සියලුම අපේක්ෂකයින් ඉහත (අ) හෝ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් කවර හෝ එක් කොටසකට පමණක් පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

II කෘෂිකර්ම නිලධාරි, කථිකාචාර්ය සහ විෂයානුගත විශේෂඥ තනතුරු සඳහා ප්‍රශ්න පත්‍රය ඃ

01. *සාමාන්‍ය කෘෂිකර්මය* :

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප, ඉඩම් සංවර්ධනය, භූමි සැකසීම හා ආම්පන්න, හෝග ස්ථාපනය හා ඒ සඳහා අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර, පස හා පසෙහි සාරවත් බව, තවාන් හා තවාන් පාලන, රෝපන ද්‍රව්‍ය, පළිබෝධ හා පළිබෝධ මර්ධනය, පැළෑටි සංරක්ෂණ උපකරණ, හෝග වගා ක්‍රම, ජල සම්පාදන ක්‍රම, ඒකාබද්ධ ගොවිතැන්, ආරක්ෂිත කෘෂිකර්මය, ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම, අස්වැන්න නෙලීම හා අස්වැන්න නෙලන උපකරණ, පසු අස්වනු හානි, ගොවිපල් නිෂ්පාදන සකස් කිරීම, විශේෂිත ප්‍රදේශවල වගා කිරීමට සුදුසු එළවළු වර්ග, පළතුරු, පියළි හෝග සහ ධාන්‍ය තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු, ඒකාබද්ධ පළිබෝධ පාලනය, ඒකාබද්ධ පැළෑටි පෝෂණ පද්ධති, ශාක ආරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත.

02. *හෝග නිෂ්පාදනය* :

ශෂ්‍ය විද්‍යාව, කෘෂි දේශගුණය සහ පරිසරය, භූමි සංවර්ධනය සහ බිම් සැකසීම හෝගවල වැඩීමේ මූලධර්ම සහ පැළෑටි භෞතවේදය, හෝගවල වැඩීම මැනීම, අස්වනු සංරචක, පොහොර නිර්දේශ හා ඒවායේ කාර්යක්ෂමතාවය, වල් පැළෑටිවල ජීව විද්‍යාව සහ මර්ධනය, ජල සම්පාදනය, ශෂ්‍ය විද්‍යාව, හෝග හා ජලය අතර සම්බන්ධතාවයේ මූලධර්ම

03. *ක්ෂේත්‍ර හෝග* ඃ

හැඳින්වීම, පාරිසරික අවශ්‍යතාවන්, ශාක විශේෂ හා ප්‍රභේද, පැළෑටි වර්ධනයේ භෞතවේදය, අස්වැන්න තීරණය කිරීමේ කායික විද්‍යාත්මක මූලධර්ම, වී හෝගයේ ශෂ්‍ය විද්‍යාව, හෝග පාලනය හා නිෂ්පාදනය, උක්බිම, ධාන්‍ය, රනිල, අලබෝග සහ වෙනත් වැදගත් ක්ෂේත්‍ර හෝග (දුම්කොළ, ලූණු, කෙඳි හෝග සහ තෙල් හෝග)

04. *හෝග පාලනය* :
අතුරු හෝග වගාව, අස්වැන්න නෙලීම හා සැකසීම

05. *උද්‍යාන බෝග නිෂ්පාදනය* :
පළතුරු නිෂ්පාදනය, පෝෂණ අගය, සාමාජික හා ආර්ථික සාධක, ආරම්භය හා ව්‍යාප්තිය, පාරිසරික අවශ්‍යතාවන්, වගා ක්‍රම, නව තාක්ෂණික ක්‍රම භාවිතය.

06. *පළතුරු, එළවළු හා මල් නිෂ්පාදනය* :

තවාන් පාලනය, උද්‍යාන පාලනය, හෝග ආශ්‍රිතව නව තාක්ෂණයන් හා වගා ක්‍රම, පළතුරු හා එළවළු හෝග වැඩි දියුණු කිරීම, පළතුරු හා එළවළු මූලික වූ හෝග වගා ක්‍රම, පසු අස්වනු හානි, පළතුරු හා එළවළුවලට පසු අස්වනු ජෛව තාක්ෂණය, පළතුරු හා එළවළුවලට දේශීය හා විදේශීය වෙළඳ පොළවල් නූතන සීමාවන් හා අනාගත උපාය මාර්ග, එළවළු නිෂ්පාදනය සඳහා අවශ්‍යතාවයන්, එළවළු මූලික වූ හෝග වගා ක්‍රම, අලෙවිය, මල් වගා කර්මාන්තය, ප්‍රචාරන තාක්ෂණය වගා ක්‍රම, ප්‍රශස්ත පරිමිති, භූමි අලංකරණ මූලධර්ම.

07. *කෘෂිකර්ම ව්‍යාප්ති හා පුහුණුව* :

කෘෂිකර්ම ව්‍යාප්තියේ විග්‍රහය හා පරමාර්ථ, කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකර්ම ව්‍යාප්තිය, අළුත් ක්‍රම භාවිතය හා පතුරුවාලීම, සන්නිවේදනය, ව්‍යාප්ති ඉගැන්වීමේ ක්‍රම, ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන ව්‍යාප්ති ප්‍රවේශයන්, පර්යේෂණ ව්‍යාප්ති සම්බන්ධතාව, ව්‍යාප්ති වැඩසටහන් සැළසුම් කිරීම, ව්‍යාප්ති වැඩසටහන් සුපරීක්ෂණය හා ඇගයීම, ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාප්තිය හා සම්බන්ධ වූ ආයතන, වැඩිහිටි අධ්‍යාපනය, පුහුණු කිරීමේ පිළිවෙල, පුහුණු අවශ්‍යතා හඳුනාගැනීමට භාවිත කෙරෙන විවිධ ක්‍රම, පාඨම් සැළසුම් සැකසීම, පුහුණුව ඇගයීම, පුහුණුව සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය.

08. *බීජ තාක්ෂණය* :

බීජ කායික විද්‍යාව, බීජ ව්‍යුහය, බීජ රූප විද්‍යාව, බීජ ප්‍රරෝහණය, බීජ ශක්තිය, බීජ පරීක්ෂා කිරීම, බීජ ප්‍රරෝහන ශක්තිය හා පාරිශුද්ධතාව පිළිබඳ පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථාවන්, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

III. කෘෂි ආර්ථික විද්‍යාඥ තනතුර සඳහා ප්‍රශ්න පත්‍රය

01. *කෘෂිකාර්මික නිෂ්පාදන ආර්ථික විද්‍යාව හා ගොවිපල් පාලනය* :

කෘෂිකාර්මික නිෂ්පාදනයේ දී ගොවිපල් පාලනයේ ඇති වැදගත්කම, මූලික සංකල්ප, නිෂ්පාදන ශ්‍රිතය, නිෂ්පාදන ශ්‍රිතයන්හි ස්වරූප, නිෂ්පාදන ශ්‍රිතයේ හැඩය, නිෂ්පාදන උපේක්ෂා වක්‍ර ත්වරණය, සම ආදායම් රේඛාව, උපයන සම්පත් සම්බන්ධතාව හා පිරිවැය අවම ප්‍රමාණයට අවධානය පිළිබඳ මූලධර්ම, හීනවන ඵලදා න්‍යාය, ආදේශය හා ආදායම් ප්‍රතිවාපාක කෘෂිකර්මයේ ඇති අවදානම හා අඩමානය, අඩමානයට මුහුණදීම සඳහා නිෂ්පාදන සකස් කිරීමේ නැමියාව හා විවිධාංගනය, කෘෂිකාර්මික මිළ නියම කිරීමට අදාළ වන පරිදි මිළ න්‍යාය, බෝග සහ සත්ත්ව සංයෝග අගය කිරීම, ගොවිපල් ප්‍රමාණය හා පරිමාණකූල ඵල, පවුල් ගොවිපල්වල වැදගත්කම හා සාපෙක්ෂ වාසිය පිළිබඳ මූලධර්ම, ගොවිපල් සංවිධානයේ ශක්තිමත් හා දුර්වල කරුණු නිර්ණය කිරීමේ දී සටහන්වල ඇති වැදගත්කම හා උපරිම කරන ආකෘති සඳහා මෙම තොරතුරු ඇතුලත් කිරීම.

02. *කෘෂිකාර්මික අළෙවිය* :

අළෙවි කිරීමේ සාමාන්‍ය මූලධර්ම, නිෂ්පාදනයේ හා අළෙවියේ සාපේක්ෂ වැදගත්කම, ශ්‍රී ලංකාවේ අළෙවිය පිළිබඳ කටයුතු කරන ආයතන, අළෙවි මාර්ග වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහිලා එවැනි ආයතනයක කාර්යභාරය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අළෙවි කිරීමේදී මුහුණ පෑමට සිදුවන ගැටලු හා අළෙවි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අදාළ මූලධර්ම.

03. *ඉඩම් ආර්ථික විද්‍යාව* :

ආර්ථික විද්‍යාමය සංකල්ප ඉඩම් පරිශීලනයට බලපාන අයුරු, ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ඉල්ලුම හා සැපයුම, ඉඩම් පරිශීලන කටයුතු ශ්‍රී ලංකාවේ සැළසුම් කරන අයුරු, ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීමේ හා මිනිසුන් පදිංචි කරවීමේ වැඩසටහනේ වැදගත්කම.

09-185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.